**බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව - 2023**

-----------------------------------------

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>තත්ත්වාගණනය කළ මතය</u>

බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්</u>

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප නොවේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| ------------------------ | -------------------------- | ---------------------- |
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ රු. 3,526,237 ක් වුවත් එය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ රු. 6,859,186 ක් ලෙස රු. 3,332,949 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | නිවැරදි ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ප්‍රාදේශීය සභාවට අයත් වෙහෙරගොඩ සහ මීගහයාය සුසාන භූමි ඉඩම්වල වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | 2024 වර්ෂයේදී සියලුම ඉඩම්වල වටිනාකම් තක්සේරු කර ගිණුම් ගත කරන බව. | සභාව සතු සියලු වත්කම් හඳුනා ගෙන ගිණුම් ගතකළ යුතුය. |
| (ඇ) සතිපොළ බහුකාර්ය ගොඩනැගිල්ල සඳහා තෙකලා විදුලිය ලබාගැනීම සඳහා දරන ලද රු. 529,891 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | නිවැරදි ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය. |
| (ඈ) 2022 වර්ෂයේ දේපල අත්පත්කර ගැනීම හා වැඩි දියුණුකිරීම සඳහා දරන ලද රු. 2,918,412 ක ප්‍රාග්ධන වියදම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | සියලු වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) සමාලෝචිත වර්ෂය තුල ප්‍රාදේශීය සභාවට පරිත්‍යාග ලෙස ලැබුණු ගස් කපන යන්ත්‍රය, ප්ලාස්ටික් ජල ටැංකිය සහ tablet computer ය (Lenovo) යන වත්කම්වල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනවල ඇතුලත් කර ඇති බව. | සභාවට ලැබෙන සියලු වත්කම්වල වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) සමාලෝචිත වර්ෂය තුල පුස්තකාල සඳහා පරිත්‍යාග ලෙස ලැබුණු පොත් 74 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කරන බව. | පුස්තකාල පොත්වල වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු. 6,327,295 ක් වුවත් එය රු. 6,095,465 ක් ලෙස රු. 231,830 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | නිවැරදි ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය. |
| (ඌ) සමාලෝචිත වර්ෂයට අදාලව ස්ථාවර තැන්පත් සඳහා ලැබිය යුතු රු. 66,879 ක පොලී ආදායම් හඳුනාගෙන ගිණුම්ගතකර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | සභාව සතු සියලු ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| (එ) සමාලෝචිත වර්ෂයේ සෞඛ්‍ය සේවා අංශයේ වැටුප් හා දීමනා වියදම රු. 196,033 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | නිවැරදි ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය. |
| (ඒ) සමාලෝචිත වර්ෂයේ සුහසාධක සේවා සඳහා ලද රු. 991,057 ක ප්‍රාග්ධන ආධාර සහ ඉන් දරන ලද ප්‍රාග්ධන වියදම මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව දන්වමි. | නිවැරදි ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය. |
| (ඔ) ප්‍රාදේශීය සභාවට විරුද්ධව බාහිර පාර්ශවයක් විසින් නඩුවක් පවරා තිබුණු අතර ඒ සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී හෙළිදරව් කරන බව. | ආයතනයේ අඛණ්ඩ පැවැත්මට බලපාන කරුණු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |
| (ඕ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තොග අගය කිරීමේ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී තොග අගය කිරීමේ ප්‍රතිපත්තිය හෙළිදරව් කරන බව. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

### 1.6.2 <u>නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්‍ා</u>

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිදේශය** |
|---|---|---|
| තැන්පත් ලේඛනය අනුව ගිවිසුම් ඇප තැන්පත් රු. 1,759,638 ක් වුවත් එය රු. 1,831,688 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු. 72,050 ක වෙනසක් විය. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | මූල්‍ය ප්‍රකාශන පිළිබඳව ගිණුම් ශේෂ සහ උපලේඛන එකඟ කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| ----------------------- | --------------------------- | ---------------- |
| එකතු වටිනාකම රු. 457,771,158 ක් වූ වත්කම් විෂයයන් 04කට අදාලව තක්සේරු වාර්තා, හිමිකම් ඔප්පු සහ යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | 2024 වර්ෂයේ දී වෘත්තිය තක්සේරුවක් සිදුකර වටිනාකම් නිවැරදිව ලේඛනගත කර ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | මූලා‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| ---------------------------------- | ----------------------- | ------------------------- | ------------- |
| **(අ)1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | | | |
| (i) 19 (xii) වගන්තිය | ප්‍රාදේශීය සභාවට අයත් කඩ කාමර 14 ක් බදු දීමේ දී විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනිමට අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇති බව. | සභාවේ දේපල දීර්ඝ කාලිනව බදුදීමට අදාලව විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) 24(1) වගන්තිය | මාර්ග ඉන්වෙන්ට්‍රියේ ඇතුළත් මාර්ග 254 ක් ගැසට් පත්‍රයේ පළ කිරීමට සහ මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මෙම කටයුත්ත කඩිනමින් සිදුකරන බව. | මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීනව පවත්වා ගතයුතු අතර එහි ඇතුලත් මාර්ග ගැසට් පත්‍රයේ පලකළ යුතුය. |
| (ආ) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 83(1) වන වගන්තිය | 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා අනුමත කර තිබුණු ගොඩනැගිලි සැලසුම් 116 ක් පරීක්ෂා කර අනුකූලතා සහතික නිකුත් නොකිරීම හේතුවෙන් බලප්‍රදේශයේ ගොඩනැගිලි ඉදිකිරීම් නියාමනයට ලක් වී නොතිබුණි. | ඉදිරියේදී මෙම කටයුතු නිවැරදි කරන බව. | බලප්‍රදේශයේ සිදු කරන ඉදිකිරීම් නියාමනයට ලක් කළ යුතුය. |
| (ඇ) 2014 දෙසැම්බර් 05 දිනැති අංක 9/ආ/4 දරන මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, සංස්කෘතික කටයුතු, සමාජ සුභ සාධන සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන හා ඉදිකිරීම් අමාත්‍යාංශ ලේකම්ගේ ලිපියෙහි 03 ඡේදය | අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ව අනුමැතියකින් තොරව කැබ් රථයක් අලුත්වැඩියා කර ඒ සඳහා රු. 867,000 ක මුදල් ගෙවා තිබුණි. | අදාල ගෙවීම් කටයුතු සිදුකර ඇත්තේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ලද මුදල්වලින් බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) 2010 අගෝස්තු 17 දිනැති විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය | වීථි පහන් ලේඛනය අනුව, වීථි පහන් 525 ක් සවිකර තිබුණද, වීථි ආලෝකකරණය සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්ගතවී නොතිබුණි. | පළාත් පාලන කොමසාරිස් වෙතින් උපදෙස් පතා ලිපි යොමුකර ඇති අතර ලබාදෙන උපදෙස් අනුව කටයුතු කරන බව. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 11,397,832 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,409,424 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභා ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,250,274 | 3,404,891 | 2,341,343 | 1,063,549 | 1,150,200 | 911,857 | 718,998 | 192,859 |
| (ii) | කුලී | 3,949,600 | 3,876,782 | 3,707,307 | 169,475 | 3,055,200 | 3,695,759 | 3,478,159 | 217,600 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 730,200 | 444,150 | 444,150 | - | 736,000 | 498,975 | 498,975 | - |
| (iv) | වෙනත් ආදායම් | 22,250,000 | 17,891,606 | 7,322,119 | 10,569,487 | 10,762,500 | 6,839562 | 3,742,510 | 3,097,052 |
| | එකතුව | 30,180,074 | 25,617,429 | 13,814,919 | 11,802,511 | 15,703,900 | 11,946,153 | 8,438,642 | 3,507,511 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
| --- | --- | --- |
| **වරිපනම් හා බදු** | | |
| (අ) සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු. 2,797,756 ක් වූ වරිපනම් බදු ආදායමෙන් රු. 1,001,196 ක් හෙවත් සියයට 36 ක ප්‍රමාණයක් දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | හිඟ බදු මුදල් අය කරමින් පවතින බව. | වර්ෂයට අදාල සියලු ආදායම් අයකර ගත යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ දී පැවති රු. 506,825 ක් වූ හිඟ වරිපනම් බදු ආදායමෙන් වර්ෂය තුලදී රු. 272,441 ක් හෙවත් සියයට 54 ක ප්‍රමාණයක් අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඇ) බඩල්කුඹුර සතිපොල බදුදීම වෙනුවෙන් ඉකුත් වර්ෂයට අදාලව අයවිය යුතුව පවතින රු. 19,014 ක කුලී ආදායම සමාලෝචිත වර්ෂයේදී ද අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| **කුලී** | | |
| (අ) සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු. 1,278,600 ක් වූ කඩ කාමර කුලී ආදායමෙන් රු. 58,300 ක් දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු. 307,400 ක හිඟ කඩ කාමර කුලී ආදායමින් වර්ෂය තුලදී රු. 253,400 ක් හෙවත් සියයට 82 ක ප්‍රමාණයක් අයකරගෙන නොතිබුණි. | මෙම හිඟ මුදල කොවිඩ් වසංගත කාලයේ අය නොකළ කුලී ආදායම වන අතර එය ආදායමෙන් කපා හැරීමට ගරු ආණ්ඩුකාර තුමා වෙත ඉදිරිපත් කර ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |

**බලපත්‍ර ගාස්තු**

| | | |
|---|---|---|
| වෙළඳ බලපත්‍ර, ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු පැනවිය යුතු ආයතන සම්බන්ධයෙන් සියලු ව්‍යාපාර ආයතන ආවරණය වන පරිදි සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | 2024 වර්ෂයට අදාලව මෙම කටයුතු නිවැරදි කරන බව. | සභා බලප්‍රදේශය තුල පවත්නා ව්‍යාපාර නියාමනය කළ යුතුය. |

**පරිසර බලපත්‍ර**

| | | |
|---|---|---|
| කුඩා පරිමාණ දූෂකාරක කර්මාන්ත ක්‍රියාවලි සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳ මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කර ඇති පළාත් පාලන ආයතන සඳහා වන මාර්ගෝපදේශයේ 2.5.2 වගන්තිය අනුව පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තුව හා ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තුව ලෙස අයකරනු ලබන මුදල් බැර කිරීම සඳහා වෙනම ගිණුමක් පවත්වා නොතිබුණි. | බැංකු ගිණුම විවෘත කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය. |

**වෙනත්**

| | | |
|---|---|---|
| (අ) බලප්‍රදේශයේ ස්ථාපනය කර තිබුණු දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 03 කට අදාලව 2020-2023 කාල පරිච්ඡේදය වෙනුවෙන් අයවිය යුතු හිඟ ව්‍යාපාර බදු රු. 36,000 ක් 2023 දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | හිඟ මුදල් ගෙවන ලෙස අදාල ආයතන වරින් වර දැනුවත් කර ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ආ) ජල යෝජනා ක්‍රම 2 ක ජල පාරිභෝගිකයන් 306 ක ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 284,016 ක හිඟ ජල ගාස්තු අයකරගෙන නොතිබුණි. | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 2017/2020 කාලච්ඡේදයට අදාලව අයවිය යුතු හිඟ යන්ත්‍ර කුලී ආදායම් රු. 205,470 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඇ) උසාවි දඩ රු. 1,814,635 ක් සහ මුද්දර ගාස්තු රු. 6,095,465 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

## 3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

### 3.1 <u>පනතින් පවරා ඇති කාර්යයන් ඉටුකිරීම</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

<u>පරිසර ආරක්ෂණ බලපත්‍ර</u>

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| (අ) පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත හඳුනාගැනීම සඳහා සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | ඉදිරියේදී සමීක්ෂණ කටයුතු සිදු කිරීමට සැලසුම් කර ඇති බව. | සභා බලප්‍රදේශයේ පවත්නා කර්මාන්ත නියාමනය කළ යුතුය. |
| (ආ) පරිසර ආරක්ෂණ බලපත්‍රවල වලංගු කාලසීමාව ඉක්ම වූ කර්මාන්ත 11 ක පරිසර ආරක්ෂණ බලපත්‍ර අලුත් කරවාගෙන නොතිබුණු අතර 2023 වර්ෂයේ ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු ගෙවූ ව්‍යාපාර ආයතන 27 ක් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | මෙම කටයුතු කඩිනමින් අවසන් කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව. | සභා බලප්‍රදේශයේ පවත්නා කර්මාන්ත නියාමනය කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
| --- | --- | --- |
| (අ) පුස්තකාල 05 ක බැහැර ගොස් තිබුණු පිරිවැය රු. 79,588 ක් වූ පුස්තකාල පොත් 547 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් නැවත ලබාගෙන නොතිබුණි. | මේ සඳහා උපදේශක කමිටුවක් පත්කර අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරන බව. | බැහැර දුන් පොත් නැවත ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2016 සහ 2017 වර්ෂවල භාණ්ඩ සමීක්ෂණයෙන් අඩි 10 ඇලුමිනියම් ඉනිමඟක හා ලීටර් 2000 ක ප්ලාස්ටික් ජල ටැංකියක ඌනතාවයන් හඳුනාගෙන තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් නිලධාරීන් හඳුනාගෙන ඔවුන්ට විරුද්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මේ පිළිබඳ විමර්ශනයක් කිරීමට පියවර ගන්නා බව. | වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අලාභ අයකරගත යුතුය. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
| --- | --- | --- |
| නක්කල සති පොළ හා කඩ කාමර 5 ක් සහ හිඟුරුකඩුව සතිපොළ සමාලෝචිත වර්ෂයේදී බදු දී නොතිබුණි. | 2023 වර්ෂයට බදුදීම සඳහා තුන්වරක් ප්‍රසම්පාදනය කළ අතර ඒ සඳහා ඉල්ලුම්කරුවෙකු . ඉදිරිපත් නොවීය. | සභාව සතු දේපලවලින් ආදායම් අයකර ගත යුතුය. |

### 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
| --- | --- | --- |
| (අ) ඉඩම් 78 ක මැනුම් කටයුතු සිදුකර නොතිබුණු අතර ඉඩම් 95 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් මැනුම් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | සභාව සතු වත්කම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) සභාව සතු කැබ් රථයේ 2023 මැයි 12 දිනට ධාවන සටහන් අනුව මයිලෝමීටරය හා වාහනයේ මයිලෝමීටරය අතර කිලෝමීටර් 1519 ක වෙනසක් පැවති අතර මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් 2023 නොවැම්බර් 30 දින වන විටත් සිදුකර නොතිබුණි. | මේ පිළිබඳ විමර්ශනයක් කිරීම සඳහා සහකාර පළාත් පාලන කොමසාරිස් දැනුවත් කර ඇති බව. | වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන ඊට අදාලව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) ප්‍රාදේශීය සභාව විසින් 2017 - 2023 කාලපරිච්ඡේදයට අදාලව කඩියන්තලාව තිරුවානා ඛණිජ නිදිය සහිත ඉඩම පවරා ගැනීමට හා ඛණිජ කැනීමේ බලපත්‍ර ලබා ගැනීම සඳහා රු. 210,760 ක වියදමක් දරා තිබුණද, සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් 30 දින වන විටත් අදාල ඉඩම පවරාගෙන නොතිබුණු අතර තිරුවානා කැනීමට අදාල පරිසර ආරක්ෂණ බලපත්‍රය හා කැනීම් පිළිබඳ බලපත්‍රය ද ලබාගෙන නොතිබුණි. | මේවන විට පරිසර බලපත්‍රය සහ කැනීම් බලපත්‍රය ලබා ගැනීම සඳහා ඉල්ලුම්කර ඇති බව. | සභාව සතු මුදල් උපරිම කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කළ යුතුය. |
| (ඇ) බඩල්කුඹුර ගොවිජන සංවර්ධන සභාවෙන් 2017 වර්ෂයේදී ලැබී තිබුණු රෝද 4 ට්‍රැක්ටර් රථය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | ඉදිරියේදී නිශ්ශංක ජාතික පාසලේ තාක්ෂණ විෂය හදාරන සිසුන්ට ප්‍රායෝගික පුහුණුව ලබා ගැනීම සඳහා මෙම ට්‍රැක්ටර් රථය ලබාදීමට කටයුතු කරන බව. | සභාව සතු වත්කම් උපරිම කාර්යක්ෂමතාවයකින් උපයෝජනය කළ යුතුය. |

### 3.5 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිදෙර්ශය** |
|---|---|---|
| ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියේ (LDSP) ප්‍රතිපාදන මත රු. 54,654,409 ක පිරිවැයක් දරා ඉදිකළ සති පොළ හා බහුකාර්ය ගොඩනැගිල්ලට අදාල ගොඩනැගිලි සැලසුම 2023 නොවැම්බර් 30 දින වන විටත් අනුමත කරවාගෙන නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකර මාස 06 ක කාලයක් පමණක් ගතව තිබුණද එහි ස්ලැබ් එකෙහි ස්ථාන කිහිපයක පිපුරුම් පැවතීම සහ ගොඩනැගිල්ලේ බිත්තිවල ස්ථාන 20 ක දිග මීටර් 46.13 ක පිපුරුම් පැවතුණි. | සැලැස්මේ අඩුපාඩු පැවතීම හේතුවෙන් සැලසුම් කමිටු අනුමැතිය සඳහා යොමුකිරීම ප්‍රමාද වී ඇත. මේ වන විට අනුමැතිය සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත යොමුකර ඇති බව සහ මෙම පිපුරුම් උෂ්ණත්වය නිසා ඇතිවන internal cracks බව තාක්ෂණික කමිටුව මගින් තහවුරු කර ඇති බව. | ගොඩනැගිලි සැලසුම සඳහා ගොඩනැගිලි සැලසුම් කමිටුවේ අනුමැතිය ලබාගත යුතු අතර ඉදිකිරීම් කටයුතු විධිමත්ව අධීක්ෂණය කළ යුතුය. |

### 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 04 ක නිලධාරීන් 06 කගේ පුරප්පාඩු හා තනතුරු 03 ක නිලධාරීන් 06 කගේ අතිරික්තයක් පැවතුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉල්ලීම් කර ඇති බව හා පසුගිය වර්ෂයන්හිදී සිදුකරන ලද නව බඳවා ගැනීම් හා වාර්ෂික ස්ථාන මාරුතුලින් මෙම තත්ත්වය උද්ගත වී ඇති බව. | කාර්ය මණ්ඩල පුරප්පාඩු පුරවාගත යුතු අතර අතිරික්ත කාර්ය මණ්ඩලයේ තනතුරු අනුමත කරගත යුතුය. |

## 4. ශිඝ්‍රුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වන වගන්තිය අනුව සමාලෝචිත වර්ෂයට අදාලව සභාවේ අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | 2024 වර්ෂයේදී අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව කටයුතු කරන බව. | සභාවේ අභ්‍යන්තර විගණන කටයුතු අඛණ්ඩව සිදුකළ යුතුය. |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රාදේශීය සභාව පිළියෙලකර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තු කළ ආදායම් හා වියදම්, වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 08 ක සියයට 6 සිට සියයට 148 දක්වාද වියදම් විෂයයන් 7 ක සියයට 12 සිට සියයට 67 දක්වාද විචලනයන් පැවතුණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි. | ඉදිරියේදී නිසි පරිදි අයවැය සකස් කිරීමට පියවර ගන්නා බව. | වාර්ෂික අයවැය ඇස්තමේන්තු වඩාත් තාත්විකව පිළියෙල කළ යුතු අතර එම ඉලක්කයන් සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |